# සුවයෙන් පෙරට

# ඉගෙනුම් පියස

# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

වාරය ii

| ශ්‍රේණිය : 6 | විෂය :බුද්ධ ධර්මය | පාඩම: දිවි මඟ සරු කරන සීලය. (8) වෙනි පාඩම. |
|---|---|---|

**පාඩමේ ඇතුළත් කරුණු කෙටියෙන්.**

- පුද්ගලයා කයෙන් හා වචනයෙන් සංවරවීම සීලය නම් වේ. ශීලයෙහි මූලික ප්‍රභේද දෙකකි.
  එනම් (1.)විරමණය- වාරිත්‍ර සීලය (විරිත්).
  (2.) සමාදානය - චාරිත්‍ර සීලය (සිරිත්).
- විරමණය යනු නොකළ යුතු දේ කිරීමෙන් වැළකී සිටීමයි.
  - උදා :සතුන් මැරීමෙන් වැළකීම, සොරකම් කිරීමෙන් වැලකීම බොරු කීමෙන් වැළකී සිටීම ආදිය.
- සමාදානය යනු කළ යුතු දේ කිරීමයි.
  - උදා: සතුන්ට මෛත්‍රිය කරුණාව දැක්වීම, තමන්ට අයත් නොවන දේවල් නොගැනීම ,ඇත්ත වචන කතා කිරීම ආදිය.
- මෙලොව ජීවිතය හා පරලොව ජීවිතය සැපවත් ගත කිරීමට උපකාරී වන මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. එය " දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා" යන නමින් ද හැඳින්වේ.
- ආර්ය අෂ්ඨාංගික මාර්ගය අංග අටකින් සමන්විත වේ. එම කරුණු අට ශික්ෂා තුනකට බෙදේ. එය "ත්‍රිවිධ ශික්ෂා" නමින් හැඳින්වේ.

- ත්‍රිවිධ ශික්ෂාව නම්, සීල ශික්ෂාව ,සමාධි ශික්ෂා, ප්‍රඥා ශික්ෂාවයි.
- සීල ශික්ෂාවට ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි ඇතුළත් සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන අංග තුන අයත් වේ.
- සම්මා වාචා යනු යහපත් වචන කථා කිරීමයි .
  එනම්,
  1. බොරු කීමෙන් වැලකීම.
  2. කේලාම් කීමෙන් වැළකීම.
  3. පරුෂ වචන කතා කිරීමෙන් වැළකීම.
  4. හිස් වචන කතා කිරීමෙන් වැළකීම.
- සම්මා කම්මන්ත යනු යහපත් වූ ක්‍රියාවන්වල නිරත වීමයි. එනම් සිදුකරන අකුසල් වලින් වැලකීමයි. සම්මා කම්මන්තයට අයත් අංග 3කි.
  1. ප්‍රාණඝාතයෙන් වැළකීම.
  2. කාමයේ වරදවා හැසිරීමෙන් වැළකීම.
  3. සොරකම් කිරීමෙන් වැළකීම.
- සම්මා ආජීව යනු යහපත් දිවි පැවැත්මයි.
- දැහැමි ලෙස තමන්ටත් අනුන්ටත් සමාජයටත් හානි නොවන ලෙස ජීවන ක්‍රමයක් (රැකියවක් ආදායම් මාර්ගයක්) අනුගමනය කිරීමෙන් ජීවත් වීම සම්මා ආජීවයයි.
- වෙළදාම, ගොවිතැන ,ගව පාලනය, රාජ්‍ය සේවය වැනි ජීවන ක්‍රම දැහැමි රැකියාවේ.
- වෙළදාම ආදියෙන් ජීවන වුවද වංචනික ක්‍රියා වලින් තොරව කළ යුතුය.

- සිල්වත් වීමේ ආනිසංස (5) කි.
  1. මහත් වූ භෝග සම්පත් ලැබීම.
  2.කීර්තිය පැතිරීම.
  3.පිරිස් මැද නොබියව කටයුතු කිරීමට හැකි වීම.
  4. මරණට භිය නොමැතිවීම.
  5. මරණින් මතු සුගතියෙහි ඉපදීම.
- මේ අනුව සීලය යනු කායික වාචසික සංවරයයි. එහිදී කයින් සිදුවන වැරදි 3 න් වැළකී වචනයෙන් සිදුවන වැරදි 4න් වැළකී ම ක්‍රියා කළ යුතුයි.

**අදාල පාඩම කියවන්න. ඉහත දැක්වූ කරුණු ඇසුරින් පිළිතුරු ලියන්න.**

## හිස්තැන් පුරවන්න

1.ආර්ය අෂ්ටාංගික මාර්ගය හඳුන්වන වෙනත් නමක් වන්නේ __________________________ යි.

2.______________, ______________, ______________යනු ත්‍රිවිධ ශික්ෂාවයි.

3.________________________ හා___________________ වශයෙන් සීලය දෙයාකාර වේ.

4. නොකළ යුත්ත නොකිරීම___________________________________ ලෙසින් ද, කළයුත්ත කිරීම____________________________________ ලෙසින්ද හැඳින්වේ.

5. සීල ශික්ෂාව ට සම්මා වාචා , ____________________________, ____________________ යන අංග තුන ඇතුලත් වේ.

(ල :2×5=10යි)

**කෙටි පිළිතුරු සපයන්න.**

6. "සම්මා වාචා" යන මාර්ග අංගයට අයත් වන කරුණු 4 ලියන්න.

1.____________________________________

2.____________________________________

3.____________________________________

4.____________________________________

(ල:5 යි)

7. "සම්මා කම්මන්ත" මාර්ග අංගයට අයත් වන කරුණු තුන(3) ලියන්න.

1.____________________________________

2.____________________________________

3.____________________________________ (ල: 5යි)

8. "සම්මා ආජීව" යනු කුමක් ද? (ල: 3යි)

"මිච්ඡා ආජීව" යනු කුමක් ද? (ල: 3යි)

නිවැරදි ජීවන ක්‍රම (4) ක් ලියන්න. (ල: 4යි)

9. සිල්වත් වීමේ ආනිසංස පහ(5) ලියන්න. ( ල: 10 යි)

1________________________________________

2.________________________________________

3.________________________________________

4.________________________________________

10. "කායේන සංවරෝ සාධු"

________________________________________

________________________________________

________________________________________

මෙම ගාථාව සම්පූර්ණ කරන්න. ( ල: 10 යි)

( මුළු ලකුණු 50යි.)